# තහනම් කාලයේ පොකිරිස්සන් ඇල්ලීම

තහනම් කාලසීමාව තුළ පොකිරිස්සන් අල්ලා කුඩුකර තිබීම සමස්ත ධීවර කර්මාන්තයටම දැඩි ලෙස බලපාන කාරණාවක් බව දන්නා නමුත් ඇතැම්හු දැඩි මුදල් අවශ්‍යතාව නිසා තහනම් කාලසීමාවද නොතකා පොකිරිස්සන් අල්ලා කුඩුකර මුහුදු පතුලේ සඟවා තැබීම සිදුකරති.

විශේෂයෙන් සැප්තැම්බර්, ඔක්තෝම්බර් හා පෙබරවාරි යන මාසවල පොකිරිස්සන් ඇල්ලීම තහනම් කර ඇත. එයට හේතුව වඳවීගෙන යන දුර්ලභ ගනයේ මත්ස්‍ය විශේෂයක් වන පොකිරිස්සන්ට ව්‍යාප්ත වීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසා දීමයි. මත්ස්‍ය කර්මාන්තයට (ධීවර) බලපාන පාඩුවද නොසලකා හරිමින් ඇතමුන් කරන ක්‍රියා නිසා සමස්ත ධීවර ප්‍රජාවටම මෙහි අනිටු පල බුක්ති විඳීමට සිදුවන බව වාර්තා වේ.

එයට හේතුව වී ඇත්තේ පොකිරිස්සන් කිලෝග්‍රෑම් එකක් රුපියල් 5000, 6000, 7000 වැනි මිල ගණන්වලට අලෙවි කිරීමට හැකිවීම හේතුවෙනි. සංචාරකයන්ගේ වර්ධනයත් සමග පොකිරිස්සන් සඳහා ද දැඩි ඉල්ලුමක් පැවතීම මෙයට හේතුව බව ධීවරයෝ පවසති.

ඇතැමකු මෙම තත්ත්වය ස්වයං අවබෝධ කරගෙන අකුරටම පිළිපදින අතර මුදලට ගිජු වූ පුද්ගලයන් පිරිසක් නිසා මෙම තත්ත්වය නැවැත්වීමට නීතිරීති පැනවීමට සිදුව ඇත.

පසුගිය 30 වැනිදා දකුණු මුහුදු තීරයේ කෝට්ටගොඩ ප්‍රදේශයේ නීති විරෝධී අයුරින් පොකිරිස්සන් අල්ලා කුඩුකර තිබෙන බවට මාතර දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කාර්යාලයට ලැබුණු රහසිගත තොරතුරක් අනුව මාතර දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති සහකාර අධ්‍යක්ෂක ජ්. පී. එල්. ජ්. සුමිත් කුමාර මහතාගේ උපදෙස් පරිදි මාතර දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කාර්යාලයේ ප්‍රධාන ධීවර පරීක්ෂක එස්. එම්. සමරනායක, ධීවර සම්පත් කළමනාකරුවන් වන් ඩබ්ලිව්. ජ්. විමලසිරි, එම්ගේ සුනිල්, එච්. පතිරණ, නිශාන්ත අලුත්වත්ත යන නිලධාරීහු කණ්ඩායම මිරිස්ස වෙරළ ආරක්ෂක බළකායේ නිලධාරීන්ගේ සහයෝගය ලබාගෙන යාත්‍රා තුනකින් ගොස් මැරීමට සූදානම් කර තිබූ මිල අධික පොකිරිස්සන් තොගයක් මුහුදු පතුලේ සඟවා තිබියදී (කුඩුකර) අල්ලාගෙන ඇත. නමුත් මේ නීති විරෝධී දූෂණ ක්‍රියාව සිදුකළ කිසිවකු අල්ලා ගැනීමට නොහැකි වී ඇත.

මේ පිළිබඳව වීසි ඇලට අදහස් දැක්වූ නම හෙළිකිරීමට අකමැති වූ දිස්ත්‍රික් ධීවර ව්‍යාපෘති කාර්යාලයේ නිලධාරියෙක් අදහස් දක්වමින් මෙසේ පැවසීය.

ඇත්තටම මත්ස්‍ය කළමනාකරණය සඳහා ධීවර ප්‍රජාවගේ දායකත්වය අනිවාර්යයෙන් ලැබීම අවශ්‍යයි. ඒ බව සියලු දෙනා තේරුම් ගත යුතුයි. අපි ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සිදුකළත් සුළු පිරිසකගේ නොමනා අක්‍රමවත් ක්‍රියා නිසා නිසි ප්‍රතිඵල ලබාගැනීමට



සැප්තැම්බර්, ඔක්තෝම්බර් හා පෙබරවාරි යන මාසවල පොකිරිස්සන් ඇල්ලීම තහනම් කර ඇත. එයට හේතුව වඳවීගෙන යන දුර්ලභ ගනයේ මත්ස්‍ය විශේෂයක් වන පොකිරිස්සන්ට ව්‍යාප්ත වීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසා දීමයි. මත්ස්‍ය කර්මාන්තයට (ධීවර) බලපාන පාඩුවද නොසලකා හරිමින් ඇතමුන් කරන ක්‍රියා නිසා සමස්ත ධීවර ප්‍රජාවටම මෙහි අනිටු පල බුක්ති විඳීමට සිදුවන බව වාර්තා වේ. එයට හේතුව වී ඇත්තේ පොකිරිස්සන් කිලෝග්‍රෑම් එකක් රුපියල් 5000, 6000, 7000 වැනි මිල ගණන්වලට අලෙවි කිරීමට හැකිවීම හේතුවෙනි. සංචාරකයන්ගේ වර්ධනයත් සමග පොකිරිස්සන් සඳහා ද දැඩි ඉල්ලුමක් පැවතීම මෙයට හේතුව බව ධීවරයෝ පවසති.

● සමන් උපුල් පිනිදිය